පළාත් පාලන දෙපාර්තමේන්තුව (බස්නාහිර පළාත)
உள்ளூராட்சித்திணைக்களம்(மேல் மாகாணம்)
DEPARTMENT OF LOCAL GOVERNMENT (WESTERN PROVINCE)

අපගේ දැක්ම :- "යහපාලනයෙන් සපිරි ඵලදායී පළාත් පාලන සේවාවක්"

| මගේ අංකය<br>எனதுஇலக்கம்<br>My No. | LGD/03/01/01 (2018) | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2020/03/16 |
|---|---|---|---|---|---|

චක්‍රලේඛ අංක : **LGD/02/2020**

**ප්‍රමුඛ**

බස්නාහිර පළාතේ,
සියලුම පළාත් පාලන ආයතන ප්‍රධානීන් වෙත,

**<u>කොරෝනා වෛරසය(COVID 19) තුරන් කිරිම සඳහා පළාත් පාලන ආයතන විසින් ගතයුතු ක්‍රියාමාර්ග.</u>**

ශ්‍රී ලංකාව තුළින් සැළකිය යුතු කොරෝනා ආසාදිතයින් සංඛ්‍යාවක් හමුවී ඇති නිසා එය වසංගත තත්ත්වයක් දක්වා වර්ධනය වීම වළක්වනු පිණිස කඩිනමින් කටයුතු කිරිම පළාත් පාලන ආයතනයන්හි වගකිමක් වන අතර ම මූලික නීතියෙන් ලබා දි ඇති බලතල මත අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙය බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමිය අවශ්‍ය උපදෙස් ලබා ඇත. මීට අදාළව, රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ 2020.03.15 දිනැති ස්වදේශ කටයුතු චක්‍රලේඛ අංක 10/2020 මගින් එකී කරුණු වැඩිදුරටත් අවධාරණය කර ඇත.

(02) පළාත් පාලන ආයතනයට අදාල අණ පනත් මගින් එක් එක් සභා බල ප්‍රදේශයන්ගේ මහජන සෞඛ්‍ය ප්‍රරෝහණය කිරිමේ හා ආරක්ෂා කිරිමේ කාර්යයන් සඳහා වූ පොදු පරිපාලන අධිකාරිය, බල ප්‍රදේශයේ පළාත් පාලන ආයතනය විය යුතු බව නියම කර ඇත. ඒ අනුව උක්ත චක්‍රලේඛයෙන් ලබා දී ඇති උපදෙස් ප්‍රකාරව කටයුතු කිරිමේ දී සෞඛ්‍ය වෛද්‍ය නිළධාරී, ප්‍රාදේශීය ලේකම්, පොලිස් ස්ථානාධිපති ඇතුළු රාජ්‍ය ආයතන ප්‍රධානීන්, ස්වේච්ඡා හා සිවිල් සංවිධාන යන අයවලුන්ගේ සම්බන්ධීකරණය සහිතව, අදාළ රෝගී තත්ත්වය තම බල ප්‍රදේශය තුළ ව්‍යාප්තවීම පාලනය කිරිම සඳහා කඩිනමින් ක්‍රියාමාර්ග ගත යුතු බවත්, ඒ පිළිබඳව නිරන්තරයෙන් පසුවිපරම් කළ යුතු බව ද අවධාරණය කරමි.

(03) පළාත් පාලන ආයතන බල ප්‍රදේග තුළ ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ කටයුතු අඛණ්ඩව පවත්වා ගත යුතු අතර, එකී කාර්යයේ දී මෙම රෝගී තත්ත්වයේ අවදානමට සෘජුවම ලක්වන කණ්ඩායම් වශයෙන් මූලිකව එකී රාජකාරී කටයුතු වල නියැලෙන්නන් හා ඊට අදාළ ක්ෂේත්‍ර කටයුතුවල නියලී සිටින්නන් හඳුනා ගත හැකිය. ඒ අනුව ඔවුන්ගේ සෞඛ්‍යාරක්ෂාව වෙනුවෙන් අවශ්‍ය සියලු ක්‍රියා මාර්ග (සෞඛ්‍යාරක්ෂිත මෙවලම්, විෂබීජාණුහරණ අත්සේදූම් දියර හා අත් ආලේපන දියර) කඩිනමින් ගැනීමට කටයුතු කරන මෙන් දන්වා සිටිමි. එකී ක්ෂේත්‍රයන්හි නියැලෙන්නන් විසින් ස්වකීය සෞඛ්‍යාරක්ෂිත ක්‍රියාමාර්ග අනුගමනය කිරිම පිළිබඳව නිරන්තර අධීක්ෂණය සිදු කරන ලෙස මහජන සෞඛ්‍ය පරික්ෂක, තාක්ෂණ නිලධාරී හා අදාළ පරිපාලක නිළධාරින්හට අවශ්‍ය මග පෙන්වීම් ලබා දෙන ලෙසට ද දන්වා සිටිමි.



| ලිපිනය / முகவரி/Address | අංක 204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල / இல.204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுள்ள / No. 204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | පොදු<br>General | කොමසාරිස්<br>Commissioner | පාලන හා මානව සම්පත්<br>Admin / HR | නීති<br>Legal | සැලසුම්<br>Planning | ගිණුම්<br>Accounts | විමර්ශන<br>Investigation | ආයතන පරිපාලන<br>Establishment | ප්‍රජා සංවර්ධන<br>Community Development |
| | 2093156 | 2092570 | 2092574/2092576 | 2092572 | 2092571 | 2092573 | 2092580 | 2092582 | 2092583 |
| ෆැක්ස් / பெக்ஸ்/ Fax | 2092577 | වෙබ් ලිපිනය/ வெப்தளம்/Web | www.lgd.wpc.gov.lk | ඊමේල් /ஈமெயில்/ Email | lgd@wpc.gov.lk | | | | |

(04) බල ප්‍රදේශ තුළ ජනතාව ඒකරාශිවන පළාත් පාලන ආයතනය සතු ස්ථාන (ආයතන පරිශ්‍රය, මාතෘ සායන, පුස්තකාල, ආයුර්වේද මධ්‍යස්ථාන, පොදු වෙළඳ පොළ ආදී) හා පොදු ස්ථාන(බස් හා දුම්රිය නැවතුම්පොළ, ආරෝග්‍ය ශාලා ආදී ) සඳහා අත් පිරිසිදු කිරීමේ දියර හා ජලය සපයා දීමට කඩිනම් වැඩ පිළිවෙලක් සකස් කර ක්‍රියාවට නැංවීම අත්‍යවශ්‍ය බැව් අවධාරණය කරමි.

(05) මෙම රෝග ව්‍යාප්ත තත්ත්වය යටතේ මේ සම්බන්ධයෙන් වරින් වර නිකුත් කරන ලද චක්‍රලේඛ හා උපදෙස් ප්‍රකාරව, පළාත් පාලන ආයතන විසින් මහජනතාව ඒකරාශි වන රැස්වීම්, උත්සව, පුහුණු වැඩසටහන්, ජංගම සේවා හා තරඟ සංවිධානය කිරීම් යනාදිය, නැවත දැනුම් දෙන තෙක් තාවකාලිකව අත්හිටුවීමට පියවර ගන්නා මෙන් අවධාරණය කරමි.

(06) කොරෝනා රෝග පාලනය කිරීමට පත්කර ඇති කොරෝනා මර්දන කාර්ය සාධන බලකාය, බස්නාහිර පළාතේ ගරු ආණ්ඩුකාරවර විශේෂඥ වෛද්‍ය සීතා අරඹේපොල මැතිණියගේ ප්‍රධානත්වයෙන්, මේ වන විට අංක 1090, ශ්‍රී ජයවර්ධනපුර මාවත, රාජගිරිය යන ස්ථානයේ ස්ථාපිත කර ඇත. ඒ අනුව, අවශ්‍ය සහාය ලබා දීමට හා තොරතුරු ලබා ගැනීමට අංක 117 දුරකතනය ඔස්සේ හා සෞඛ්‍ය අමාත්‍යංශයේ වසංගත රෝග විද්‍යා අංශයේ වෙබ් අඩවිය වන http://www.epid.gov.lk සමග සම්බන්ධ වීමේ හැකියාව ද ඇත.

(07) කොරෝනා රෝග තත්ත්වය තව දුරටත් ව්‍යාප්තවීම අවම කිරීමට අවශ්‍ය සේවාවන් ඉටු කිරීමට අදාළ කාර්යය මණ්ඩලය සුදුසු පරිදි සේවයේ යෙදවීමට අවශ්‍ය කටයුතු සළසා ගන්නා ලෙස දන්වා සිටින අතර ඉදිරියේ දී ලබාදීමට නියමිත උපදෙස් විද්‍යුත් තැපැල (e- mail) මගින් නිකුත් කිරීමට කටයුතු කරන බව වැඩිදුරටත් දන්වා සිටිමි.

**කසුන් ඇපා සෙනෙවිරත්න,**
**පළාත් පාලන කොමසාරිස්,**
**බස්නාහිර පළාත.**

පිටපත්-

| | | |
|---|---|---|
| (1) බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමිය | - | කා.දැ.ස |
| (2) ප්‍රධාන ලේකම්.(බස්නාහිර පළාත) | - | කා.දැ.ස |
| (3) පළාත් පාලන ලේකම්,(බස්නාහිර පළාත) | - | කා.දැ.ස |
| (4) ලේකම් , සෞඛ්‍ය අමාත්‍යංශය, (බස්නාහිර පළාත) | - | කා.දැ.ස |
| (5) පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ(බස්නාහිර පළාත) | - | අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු සිදු කර සහාය ලබා දීම සඳහා |
| (6) පළාත් පාලන සහකාර කොමසාරිස් (කොළඹ/ගම්පහ/කළුතර) | - | දිස්ත්‍රික්කයේ පළාත් පාලන ආයතන සම්බන්ධිකරණය සඳහා |
| (7) ජ්‍යෙෂ්ඨ ප්‍රජා සංවර්ධන නිළධාරි | - | අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු සඳහා |